# මානව සේවාක් ෂේත්‍රය
# (Human Srvice Sector)

**ඔබ මිනිසුන් ගැන සැලකිලිමත් වන අතර යම් ආකාරයකින් මිනිසුන්ට උදව් කිරීමට කැමතිද?**

මානව සේවා ෂේත්‍රයේ පුද්ගලයන්, පුද්ගලයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට, ඔවුන්ගේ පුද්ගලික අවශ්‍යතා සපුරාලීමට උපකාර කරයි. ඔබට රජයේ රෝහලක, ලාභ නොලබන ආයතනයක, සාත්තු නිවාසයක, හෝටලයක හෝ පාසලක වැඩ කළ හැකිය.

උදාහරණයක් වශයෙන් ඔබටපාසලක ඉගැන්වීම, රූපලාවන්‍යාගාරයක කොණ්ඩ කැපීම සහ වර්ණ ගැන්වීම හෝ අවමගල්‍ය නිවසක අවමගල්‍ය සේවා කලමනාකරණය කිරීම සඳහා වැනි සේවා ලබා දිය හැකිය.

**මානව සේවා ක්ෂේත්‍රයේ රැකියා/ වෘත්ති,**

**1. ළමා, පවුල් සහ පාසල් සමාජ සේවක**
දරුවන්ට පාසලේ වැඩ හොඳින් කිරිමට උපකාර කිරීම සඳහා දරුවන්ට සහ පවුල්වලට සමාජ සේවා සැපයීම.

**2. ළමාරක්ෂක**
දිවා සුරකුම් තුළළමයින් රැක බලා ගැනීම.

**3. පූජ්‍ය**
ආධ්‍යාත්මික මඟ පෙන්වීම් ලබා දීම සහ ආගමික සේවා මෙහෙයවීම.

**4. සායනික, උපදේශන සහ පාසල් මනෝවිද්‍යාඥ**
දරුවන්ගේ, පවුල්වල හෝ වෙනත් කණ්ඩායම්වල චිත්තවේගීය හා මානසික ගැටලුවලට ප්‍රතිකාර කරන්නා.

**5. ප්‍රජා සේවක**
පුද්ලයන්ට සහ ප්‍රජාවට සෞඛ්‍ය සම්පන්න හැසිරීම් අනුගමනය කිරීමට උදවු කිරීම.

**6.ණය උපදේශක**
මුදල් ගැන මිනිසුන්ට සහ සංවිධානවලට උපදෙස් ලබා දීම.

**7. එම්බාම්කරු**
භූමදානය සඳහා සිරුරු සුදානම් කිරීම.

**8. ශරීර යෝග්‍යතා හා Aerobics උපදේශක**
ව්‍යායාම ක්‍රියාකාරකම් සඳහා පුද්ගලයින්ට උපදෙස් දීම හා පුහුණු කිරීම.

**9.අවමගල්‍ය සේවා කළමනාකරු**
අවමගල්‍ය නිවාසවල ක්‍රියාකරකම් සම්බන්ධීකරණය කිරිම හෝ මෙහෙයවීම.

**10. බාබර්/කොණ්ඩා මෝස්තර/ රූපලාවන්‍ය ශිල්පී**
පාරිභෝගිකයින්ගේ හිසකෙස් කැපීම, වර්ණ ගැන්වීම සහ මෝස්තර කිරීම හෝ වේශ නිරූපණය කිරීම.

**11. සෞඛය සේවා සමාජ සේවක**
බරපතළ රෝගාබාධ සමඟ කටයුතු කරන පුද්ගලයින්ට මනෝ සමාජීය සහාය ලබා දීම.

**12. සෞඛ්‍ය අධ්‍යාපනඥ**
සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කරන හැසිරීම් ගැන මිනිසුන්ට ඉගැන්වීම හා උපදෙස් ලබා දීම.

**13. මනෝවිද්‍යාඥ (ආයතන/ සංවිධානවල)**
ආයතන/සංවිධාන තුළ සිදුවන ගැටලු අධ්‍යයනය කිරීමට මනෝවිද්‍යාවේ මූලධර්ම භාවිතකරන්නා.

**14. විවාහ සහ පවුල් චිකිත්සක (Marrige and Family Therapist)**
විවාහ හෝ පවුල් තුළ ඇති ගැටලුවලට ප්‍රතිකාර කිරීමට හෝ විසඳීමට උදව් කරන්නා.

**15. සම්බාහක චිකිත්සක**
මෘදු පටක මාංශ පේශී හැසිරවීමට ස්පර්ශය භාවිත කිරීමෙන් රෝගීන්ට උදව් කිරීම.

**16. මානසික සෞඛ්‍ය උපදේශක**
මානසික සෞඛ්‍ය ගැටලු වළක්වා ගැනීමට සහ ඔවුන්ගේ මානසික සෞඛ්‍ය වැඩි දියුණු කිරිමට පුද්ගලයින් සමඟ වැඩ කරන්නා.

**17. නැනී (Nannie)/ ළමයින් රැකබලා ගන්නා**
පුද්ගලික කුටුම්බවල දරුවන් රැකබලා ගන්නා අතර දරුවන්ගේ ශාරීරික, චිත්තවේගික, බුද්ධිමය සහ සමාජීය අවශ්‍යතා තෘප්තිමත් කිරිම සඳහා දෙමව්පියන්ට සහාය සහ විශේෂ දනුම ලබා දීම.

**18. ස්නායු මනෝවිද්‍යාඥ**
මොළයේ සහ මානසික සෞඛ්‍ය ආබාධ හඳුනාගෙන ප්‍රතිකාර කරන්නා.

Guidance & Counseling Unit, NIE, Maharagama

**19. පුද්ගලික සත්කාර සහායකයින්**
නිවෙස්වල හෝ සත්කාර ස්ථානවල දෛනික ජීවන කටයුතු සඳහා රෝගීනට උපකාර කිරීම.

**20. පුනරුත්ථාපන උපදේශක**
මිනිසුන්ට වඩාත් ස්වාධීනවීමට සහ රැකියා නියුක්ත වීමට උපකාර කිරීමට ඔවුන් සමඟ වැඩ කරන්නා.

**21. නේවාසික උපදේශක**
විද්‍යාල, නේවාසිකාගාර හෝ කණ්ඩායම් නිවාස වැනි නේවාසික පහසුකම්වල ක්‍රියාකරකම් සම්බන්ධීකරණය කරන්නා.

**22. සමාජ සහ සේවා කළමනාකරු**
සමාජ සේවා වැඩසටහන් සඳහා ක්‍රියාකරකම් සැලසුම් කිරීම සහ සමබ්නධීකරණය කිරීම.

**23. මත්ද්‍රව්‍ය උපදේශක**
මත්ද්‍රව්‍ය, මධ්‍යසාර සහ වෙනත් ගැටලු ඇති පුද්ගලයින්ට උපකාර කිරීමට තනි තනිව හෝ කණ්ඩායම් සමඟ වැඩ කරන්නා.

**24. ටේලර්/ ඇඳුම් සාදන්නා**
ඇඳුම් නිර්මාණය, ඇඳුම් සකස් කිරීම හෝ ඇඳුම් ගලපන්නා.

Guidance & Counselling Unit, NIE, Maharagama